# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,145 — 1960 ජූනි 13 වැනි සඳුද — 13.6.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)**

## වෙනත් පත් කිරීම්

**1960 අංක 241**

**ආරක්‍ෂක (ආනයන හා අපනයන) රෙගුලාසි**

ආහාර, වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍ය මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා වන මම, ජ්‍යෙෂ්ඨ සහකාර ආනයන හා අපනයන පාලක තැන්පත් සිවිල් නිලධාරි ඊ. ඇස්. ද සිල්වා මහතා, 1960 මැයි 14 දින සිට නැවත නියමයක් කරනතුරු, තම රාජකාරිවලට අතිරේකව, ආනයන හා අපනයන පාලක වශයෙන් වැඩ බැලීමට මෙයින් පත් කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1960 මැයි 13 දින,
කොළඹ 3.

---

## ආණ්ඩුවේ නිවේදන

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව**

අර්ථ නිරූපණ ආඥා පනතේ (2 වැනි පරිච්ඡේදයේ) 15 වැනි වගන්තිය සමඟ කියවනු ලැබූ, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 35 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ, 1960 ජූනි 9 වැනිද, අංක. 12,142 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ඉහතකී 35 (3) වැනි වගන්තිය ප්‍රකාර වූ දැන්වීමේ උප ලේඛනයේ සඳහන් අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය සම්බන්ධයෙන් ඇති සටහනෙහි ''තිඹිරිගස් කොටුවේ මහා විද්‍යාලය'' යන වචන වෙනුවට ''තිඹිරිගස්කොටුවේ කලින් මහා විද්‍යාලයීය ගොඩකැගිල්ල'' යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කළ බවයි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

1960 ජූනි 13 වැනි දින,
කොළඹදීය.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.

715—ජේ. ඇන්. ආර් 10400—4,350 (6/60)